වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2022

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය

அங்கவீனமுற்ற நபர்களுக்கான தேசிய செயலகம்

NATIONAL SECRETARIAT FOR PERSONS WITH DISABILITIES

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

MINISTRY OF WOMEN, CHILD AFFAIRS & SOCIAL EMPOWERMENT

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு

පටුන

පටුන.....1

පූර්විකාව.....2

විධායක වාර්තාව.....3

හැඳින්වීම.....4

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

දැක්ම සහ මෙහෙවර.....5

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සංයුතිය 6

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

සංවිධාන ව්‍යුහය.....7

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව 8

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

අධ්‍යක්ෂකගේ වාර්තාව 9

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති.....17

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශේෂ පිරික්සුම 21

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් 22

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 25

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්.....26

ජනල් සටහන්.....29

විගණකාධිපතිගේ වාර්තාව 31

විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධ පිළිතුරු.....40

පූර්විකාව

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරිව 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, අභිසංවර්ධනය කිරීම , ආරක්ෂා කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම, මාර්ගෝපදේශකත්වය, සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම ප්‍රධාන කාර්යභාරයන් වේ.

2022 වර්ෂයේ දී සියලුම ආබාධ සහිත ප්‍රජාවගේ සුභසාධනය, අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීමේලා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ මූලික අරමුණවේ.

විධායක වාර්තාව

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ආබාධිත ප්‍රජාව සඳහා 2022 වර්ෂයේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. රටේ පැවති වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය මෙන්ම ඉන්ධන අර්බුදය හේතු කොටගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වුවත් 2022 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩසටහන්වල ළඟාකරගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය 99.99% කි.

ආබාධිත ප්‍රජාවගේ සුබසාධන හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය මුල්කරගෙන ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති අතුරින් රටේ පැවති ආර්ථික අර්බුදය හේතු කොටගෙන ජීවනාධාර වැඩසටහනට හා වකුගඩු රෝගීන් සඳහා දෙනුලබන ජීවනාධාර වැඩසටහන සඳහා සුවිශේෂී ස්ථානයක් හිමිවිය. ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ආධාර ඇතිව මාස 06 ක් සඳහා රුපියල් පන්දහසේ නිත්‍ය දීමනාවට අමතරව රුපියල් දෙදහස් පන්සීයක අමතර දීමනාවක් හා පොරොත්තු ලේඛන ගත තැනැත්තන් සඳහා රුපියන් පන්දහසක දීමනාවක් ලබා දීම සිදු කරනු ලැබීය. මෙම වැඩසටහන තුළින් ලංකාව පුරා විසිරී සිටින අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් 98369 දෙනෙකුට හා අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් 63428 දෙනෙකුට ප්‍රතිලාභ ලබාදීමේ හැකියාව ලැබිණි. රටේ පැවති වාතාවරණය හමුවේ මෙම අභියෝගය ජය ගැනීමට අපට හැකිවිය.

මෙම භාරධුර කාර්යය සාර්ථක කර ගැනීම සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යතුමාගේ මහ පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යය මණ්ඩලයේ සහයෝගයද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් හා මහ පෙන්වීමත්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලෙක්ම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන සියලුම සමාජ සේවා නිලධාරීන් ඇතුළු සමස්ථ ක්‍රියාවලියට දායක වූ සියලුම නිලධාරීන්ට විශේෂ ස්තූතිය හිමිවිය යුතුය.

හැඳින්වීම

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවක් හා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ඒ අනුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකර දීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අරමුණින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යලය ක්‍රියා කරනු ලැබේ.

2022 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් උදෙසා සිදු කරනු ලබන නෛතික සේවාවන් මෙන්ම සුභසාධනය, පුනරුත්තාපනය, සවිබලගැන්වීම සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී . වර්තමාන සමාජ රටාවට අනුරූප වෙමින් ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත නැවත සංශෝධන කිරීම, සංඥා භාෂා පනත කෙටුම්පත් කිරීම, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුව ප්‍රවේශ නියෝගවලට අදාළව පවතින ගැසට් පත්‍රය කෙටුම්පත් කිරීම මෙන්ම අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැනැත්තන් සඳහා ජීවනාධාර දීමනා, වකුගඩු ආධාර දීමනා, වෛද්‍යාධාර, අධ්‍යාපන ආධාර, ආධාරක උපකරණ, නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර ලබා දීම හා ආබාධ සහිත තැනැත්තන් පෞද්ගලික අංශයේ රැකියා ගත කිරීම, හැකියා වර්ධන වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් වැනි වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

එමඟින් ආබාධ සහිත තැනැත්තන් සවිබලගැන්වීම තුළින් යැපුම් මානසිකත්වයෙන් මුදවා ඔවුන් රටේ සම්පත් බවට පත්කර දළ ජාතික නිෂ්පාදනයේ හවුල්කරුවන් කරගැනීමත් සමාජයේ අයහපත් ආකල්ප සාම්ප්‍රදායික රාමුවෙන් බැහැරවීමට අවස්ථාව ලබා දී ඔවුන්හට අභිමානවත් ජීවන තත්ත්වයක් උදාකරලීම අපගේ පරමායන අභිලාෂය වේ.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය
1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ
අයිතිවාසිකම් පනතේ නෛතික ප්‍රතිපාදනවලට යටත්ව
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ
ජාතික මහ ලේකම් කාර්යාලය ස්ථාපිත කොට ඇත.


දැක්ම

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීම.


මෙහෙවර

මාර්ගෝපදේශකත්වය,සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම තුළින් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා සුරක්ෂිතභාවය සහතික කිරීම.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව

ආබාධ සහිත තැනැත්තන් අසරණ හෝ උපකාර ලැබිය යුතු කොටසක් ලෙස බොහෝ විට සමාජගත වී ඇත. මෙම නිශේධනාත්මක ආකෘතියට කොටුවී යැපුම් මානසික තත්ත්වයක ජීවත්වන මෙම ප්‍රජාව කායික මෙන්ම මානසික වශයෙන් ද සමාජයෙන් මුළු ගැන්වී සිටීමට උත්සහ දරන අයුරු පෙනී යයි. ස්වශක්තියෙන් නැගී සිටීමට, හැකියාවන් වර්ධනය කර ගැනීමට උත්සාහ නොගෙන රජයේ සුභසාධන ආධාර මත යැපීමටත් අනුකම්පාව ලබමින් උදාසීන ජීවිතයකට හුරුවී ඇත. මෙම තත්ත්වය පවුලට, සමාජයට මෙන්ම රටේ ආර්ථික, සමාජීය සාධක කෙරෙහි සිදු කරනු ලබන බලපෑම අයහපත්ය. මෙම ආකල්පයන්ගෙන් හා ආකෘතියෙන් මුදවා ඔවුන්ව සමාජයේ සාඩම්බර කොටස් කරුවන් බවට පත් කිරීමේ වගකීම අප අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, සහ ආරක්ෂා කිරීම, වග බලාගැනීම සඳහා 1996 අංක 28 දරණ පනත යටතේ ආබාධ සහිත තැනැත්තන් උදෙසා ජාතික සභාවක් මෙම අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇත. මෙම පනතින් ලැබී ඇති බලතල ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා මෙම ජාතික සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් සුභසාධනය, ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම සහ පාලනය කිරීම, සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම, පුනරුත්ථාපනය කිරීම, ආබාධ සහිත පුද්ගලයින් සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු මෙහෙයවීම, උපදෙස් දීම සහ ආධාර දීම, භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සහ ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබා දීම යන අනුශාංගික කාරණාද සාක්ෂාත් කරනු වස් විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම වැඩසටහන් ආබාධ සහිත ප්‍රජාව නව දිශානතියක් කරා මෙහෙයවීම සඳහා පාදක කර ගනු ලැබිණි.

මෙම කාර්යභාරය ඉටු කිරීමෙහිලා ප්‍රධාන වගකීම දරණ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවත්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයත් කැපවීමෙන් කරන සේවය අගය කළ යුතු අතර මෙම කර්තව්‍ය සඳහා පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් තම කාලය හා ශ්‍රමය වැය කරමින් ආබාධිත ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් කරනා මෙහෙවර අගය කරන අතර මාගේ කෘතඥතාව මේ සියලු දෙනා වෙත පුද කර සිටිමි.

අනූප පස්කුවල්
රාජ්‍ය අමාත්‍ය සමාජ සවිබලගැන්වීම්
කාන්තා, ළමා හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සභාපති
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව

රජයේ ප්‍රතිපත්ති, තීන්දු තීරණයන්ට අනුකූලව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණය හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ අත්කරගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ. මෙම වර්ෂය තුළ රටේ පැවති වසංගත තත්ත්වය, ආර්ථික අර්බුදය, තෙල් අර්බුදය වැනි අභියෝගාත්මක තත්ත්වයක් යටතේ වුවද ඉතා ඉහළ කාර්යය සාධනයක් ළඟා කර ගැනීමට හැකිවිය.

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නව පනත් කෙටුම්පත

මෙම පනත වර්තමාන සමාජ රටාවට අනුරූප වෙමින් ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා නැවත සංශෝධන කිරීමේ කටයුතු සිදු කරමින් නව පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

සංඥා භාෂා පනත් කෙටුම්පත

සංඥා භාෂාව පිළිගත් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශයේ නිරීක්ෂණයන්ට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද සංඥා භාෂා පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ නිශ්කාශන සහතිකය ලබාගැනීම සඳහා යොමු කොට ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැඟිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා සංශෝධන සිදු කරමින් පවතී.

රැකවරණ මධ්‍යස්ථාන 03ක් ස්ථාපනය කිරීම

දීප ව්‍යාප්තව රැකවරණ මධ්‍යස්ථාන 6ක් ඉදි කිරීම සඳහා අමප/18/0755/711/015 අංක දරණ පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ වන විට ගම්පහ - මීරිගම, මාතලේ -

දඹුල්ල ලෙස ඉඩම් හඳුනාගෙන පවරා ගැනීමට කටයුතු සිදු කරමින් සිටී. මාතර අකුරැස්ස මධ්‍යස්ථානයෙහි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතුවල අවසන් අදියරේ පවතී.

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා රු.5000/- මාසික ජීවනාධාර දීමනාව ලබා දීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2007 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන මඟින් ආබාධ සහිත තැනැත්තන් හා ඔවුන්ගේ පවුල් සවිබලගැන්වීම සඳහා කටයුතු කෙරේ. ජීවන මට්ටම උසස් කිරීම, පෝෂණය ඉහළ නැංවීම, මානසික හා සමාජීය තත්ත්වය වැඩිදියුණු කිරීම මෙහි දී හඳුනා ගත හැකිය. 2007 වර්ෂයේ සිට ලබාදුන් රු.3000/- ක ජීවනාධාරය 2019 වසරේ මැයි මස සිට රු.5000/- දක්වා වැඩි කර, 2019 ජූලි මාසයේ සිට 32,000 වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාවට නව ප්‍රතිලාභීන් 40,000ක් එක් කර මුළු පිරිස 72,000 ක් දක්වා වැඩි කිරීමට පියවර ගන්නා ලදී. 2022 මැයි, ජුනි, ජූලි මාස සඳහා ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ජීවනාධාර ලබන ආබාධ සහිත තැනැත්තන් සඳහා රු. 5000/- ක නිත්‍ය දීමනාවට අමතරව රු. 2500/- ක අතිරේක දීමනාවක් සහ පොරොත්තු ලේඛන ගත අය සඳහා රු. 5000/- ක දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලදී. එසේම ආසියානු සංවර්ධන බැංකුව මඟින් සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස 03 සඳහා ද ඉහත දීමනාවන් ලබා දීමට කටයුතු කරන ලදී.

ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ හා ආසියානු සංවර්ධන බැංකුව මඟින් මාස 06 ක් සඳහා පහත පරිදි ගෙවීම් කටයුතු සිදු කරන ලදී.

අදාළ මාසය	රු. 5000/- නිත්‍ය දීමනා සඳහා		රු. 2500/- අතිරේක දීමනා සඳහා (top up)		පොරොත්තු ලේඛනගත අය සඳහා රු.5000/- දීමනාව සඳහා	
	දීමනාලාභීන් සංඛ්‍යාව	ලබා දුන් මුදල රු. මී.	දීමනාලාභීන් සංඛ්‍යාව	ලබා දුන් මුදල රු. මී.	දීමනාලාභීන් සංඛ්‍යාව	ලබා දුන් මුදල රු. මී.
2022 මැයි	71882	359.4	23837	59.6	25327	126.63
2022 ජුනි	71268	356.3	20920	52.3	25072	125.36
2022 ජූලි	71151	355.8	20474	51.2	25072	125.36
එකතුව		**1071.5**		**163.1**		**377.35**
2022 සැප්තැ.	70705	353.3	17065	42.6	12809	63.8
2022ඔක්තෝ	70704	353.4	16960	42.3	13041	64.8
2022 නොවැ.	70340	353.5	16714	41.8	12905	64.3
එකතුව		1060.2		126.7		192.9

වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම

ඇඳගත රෝගීන් 147 දෙනෙකු සඳහා සේවා සපයන රාජගිරිය වික්ටෝරියා නිවාසයේ සේවක වැටුප් හා දීමනා, ජල, විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම වෙනුවෙන් මසකට රු.මි. 0.666 බැගින් වර්ෂයට රු.මි. 8 ක මුදලක් ලබාදීමට කටයුතු කර ඇත.

අඩුආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා රු.5000/- මාසික ජීවනාධාර දීමනාව ලබා දීම

මූලය හඳුනා නොගත් කාලික වකුගඩු රෝගීන් සඳහා මාසික දීමනා ගෙවීම 2015 වසරේ සිට ක්‍රියාත්මක වේ. රු.3000/- මාසික ජීවනාධාරයක් වශයෙන් ආරම්භ කරන ලදුව වර්තමානයේ රු.5000/- මාසික ජීවනාධාරයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිර්දේශිත කාලික වකුගඩු රෝග ව්‍යාප්ත දිස්ත්‍රික්ක 11 තුළ හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 84 ක රෝගීන් සඳහා මෙම දීමනාව ගෙවන ලදී. 2020 සැප්තැම්බර් මාසයේ සිට දිවයිනම ආවරණය වන පරිදි, සියලුම වර්ගයේ වකුගඩු රෝගවලින් පෙළෙන ප්‍රතිලාභීන් 39,169ක් සඳහා ගෙවීම් සිදු කිරීමට හැකි විය. 2022 මැයි, ජුනි, ජූලි මාස සඳහා ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ වකුගඩු ආධාර ලබන දීමනාලාභීන් සඳහා රු. 5000/- ක නිත්‍ය දීමනාවට අමතරව රු. 2500/- ක අතිරේක දීමනාවක් සහ පොරොත්තු ලේඛන ගත අය සඳහා රු. 5000/- ක දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලදී. එසේම ආසියානු සංවර්ධන බැංකුව මඟින් සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස 03 සඳහා ද ඉහත දීමනාවන් ලබා දීමට කටයුතු කරන ලදී.

ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ හා ආසියානු සංවර්ධන බැංකුව මඟින් මාස 06 ක් සඳහා පහත පරිදි ගෙවීම් කටයුතු සිදු කරන ලදී.

අදාළ මාසය	රු. 5000/- නිත්‍ය දීමනා සඳහා		රු. 2500/- අතිරේක දීමනා සඳහා (top up)		පොරොත්තු ලේඛනගත අය සඳහා රු.5000/- දීමනාව සඳහා	
	දීමනාලාභීන් සඛ්‍යාව	ලබා දුන් මුදල රු. මි.	දීමනාලාභීන් සඛ්‍යාව	ලබා දුන් මුදල රු. මි.	දීමනාලාභීන් සඛ්‍යාව	ලබා දුන් මුදල රු. මි.
2022 මැයි	38945	194.7	21003	52.5	3256	16.3
2022 ජුනි	38702	193.5	18791	47	3256	16.3
2022 ජූලි	38316	191.6	20364	50.9	3256	16.3
එකතුව		579.8		163.1		48.9
2022 සැප්තැ.	38019	190.2	17126	42.8	1554	7.72
2022ඔක්තෝ	38096	190.5	16971	42.4	1565	7.84
2022 නොවැ.	37946	189.8	16901	42.4	1529	7.64
එකතුව		570.5		127.6		23.2

ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබා දීම

රැකියාවක නියැලිය හැකි මට්ටමක සිටින ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා යොමු කරන අතර, එම ආයතනය ගෙවනු ලබන මූලික වැටුපෙන් 50% (උපරිමය රු.15,000/- ක් වන පරිදි) මාස 24ක් සඳහා මෙම කාර්යාලය මඟින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආබාධ සහිත තැනැත්තන් හඳුනා ගැනීම, රැකියා සැපයීමට එකඟත්වය පළ කරන පෞද්ගලික ආයතන සම්බන්ධීකරණය වැනි කාර්යයන් සිදු කරනු ලබන අතර සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සාකච්ඡා මඟින් මෙන්ම චක්‍රලේඛයක් මඟින් ද මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. ඒ අනුව හඳුනා ගත් ආබාධ සහිත තැනැත්තන් 105 ක් පමණ 2020 වසරේ දී රැකියා ගත කිරීමට කටයුතු කරන ලදී. නමුත් රටේ පැවති ආර්ථික අර්බුදය මෙන්ම වසංගත රෝගයත් හේතුකොටගෙන පෞද්ගලික අංශයේ නව බඳවා ගැනීම් සීමා සහිත වීමත්, පැවති ආයතන වැසීයාමත් හේතුවෙන් වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් සංඛ්‍යාව 01 කට සීමා විය. නව රැකියා අවස්ථා සඳහා ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් මේ වන විට ලැබී ඇත. රැකියා ලබා දීම සම්බන්ධයෙන් පෞද්ගලික ආයතන සමඟ සාකච්ඡා කරමින් සිටී. 2023 වර්ෂයේ දී විශාල සංඛ්‍යාවකට රැකියා පුහුණු අවස්ථා ලබා දීමට අපේක්ෂිතය.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
105	10.0	2.77

වෛද්‍ය ආධාර ලබා දීම

රජයේ රෝහලින් නොසපයන ඖෂධ ලබා ගැනීමට,සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක බද්ධය ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම්ලාභී පවුල් සඳහා උපරිමය රු.20,000/- ක් දක්වා මේ යටතේ ආධාර ලබාදේ. කොවිඩ් 19 වසංගතය සහ රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් සැලසුම් කළ ජංගම සේවා පැවැත්විය නොහැකිව එම වැඩසටහනේ ඉතිරිව පැවති ප්‍රතිපාදන, මුද්‍රණ කටයුතු සිදු නොකිරීම නිසා ඉතිරි වූ ප්‍රතිපාදන, රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් රැස්වීම් පැවැත්වීම සීමිත වීම හා zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීම හේතුවෙන් වෙනත් හා පරිපාලන වියදම් වල ඉතිරිවීම්, ආර්ථික අර්බුදය නිසා මිල උච්ඡාවචන හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතුවල ගැටළු නිසා ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීම්වලදී ආධාර ලබාදීම සීමා විය, එම ඉතිරිවීම් ද යොදවා වෛද්‍යාධාර පොරොත්තු ලේඛනගතව සිටි වැඩි පිරිසකට ආධාර ලබා දීමට හැකි විය.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
683	06.00	10.44 *

* ආධාරක උපකරණ වැඩසටහනින් ඉතිරි වූ රු.මි. 0.72, මුද්‍රණ හා ප්‍රකාශන කටයුතුවලින් ඉතිරි වූ රු.මි. 01.00, වෙනත් හා පරිපාලන වියදම්වල ඉතිරිවීම් රු.මි. 2.48, ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීමෙන් ඉතිරි වූ රු.මි. 0.4 ක මුදලක් ද මෙම වැඩසටහන සඳහා යොදවන ලදී.

ආධාරක උපකරණ ලබා දීම

ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්, අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට ඇස් කණ්ණාඩි, රෝද පුටු, ඇවිදීමේ රාමු, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා උපරිම රු.20,000/- දක්වා මුදල් ආධාර ලබාදීම සිදු කෙරේ. ශ්‍රවණ උපකරණ ලබාගැනීම සඳහා රු. 15,000/- සිට රු.35,000/- දක්වා මූල්‍ය ආධාර ලබාදීම සිදුකරයි. අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා වෛද්‍ය නිර්දේශ මත මෙම ආධාරය ලබා දේ. මෙම වර්ෂයේ ජංගම සේවා 19 ක් පවත්වා උපකරණ පහත පරිදි බෙදා දී ඇත. රටේ පැවති වසංගත තත්ත්වය, තෙල් අර්බුදය හමුවේ ජංගම සේවා පැවැත්වීම සීමා සහිත විය.

කොමඩ රෝදපුටු	රෝදපුටු	අත්වාරු	කිහිළිකරු	වෝකර්	ඇස්කණ්නාඩි (ළඟ හා දුර)	ඇස් කණ්නාඩි (කියවීම්)	විශේෂ උපකරණ
01	31	09	05	10	31	13840	16

හැකියා වර්ධන වැඩසටහන

ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000/- ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මිල ගණන් උච්ඡාවචනය නිසා භාණ්ඩ ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ගැටළු මතුවීම නිසා වර්ෂයේ මුල් කාර්තුවල මෙම වැඩසටහන සඳහා අයදුම්පත් ලැබීම සීමා විය.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ආයතන 06	0.5	0.3

ස්වයං රැකියා ආධාර ලබාදීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල පවතින දරිද්‍රතාවය අවම කිරීම සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා එක් පුද්ගලයකුට හෝ පවුලකට උපරිම රු.25,000/- ක් දක්වා ස්වයං රැකියා ආධාර ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. එසේම ස්වයං රැකියාව නියාමනය, නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි කිරීමට මහපෙන්වීම හා අලෙවිය සඳහා මැදිහත්වීමද මෙහි දී සිදු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
ප්‍රතිලාභීන් 156	4.0	4.06*

ස්වෙච්ඡා සංවිධාන බලගැන්වීමෙන් ඉතිරි වූ රු.මි. 0.4 ක ඉතිරි ප්‍රතිපාදන ස්වයං රැකියා ආධාර වැඩසටහන යටතේ පොරොත්තු ලේඛනගත අයදුම්කරුවන් වෙත ලබා දෙන ලදී.

අධ්‍යාපන ආධාර ලබා දීම

අඩු ආදායම්ලබන ආබාධ සහිත දරුවන් හා ආබාධ සහිත භාරකරුවන්ගේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහනකි. මෙම වැඩසටහන යටතේ එක් වරක් පමණක් උපරිමය රු.10,000 වන පරිදි අධ්‍යාපන උපකරණ ලබා ගැනීම සඳහා ආධාර දෙනු ලැබේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
ප්‍රතිලාභීන් 421	4.0	4.31 *

ස්වේච්ඡා සංවිධාන බලගැන්වීම

මෙම මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතන 238 ක් පවතින අතර මෙම ආයතන බොහෝමයක් විධිමත් මූල්‍ය ආධාර නොලබන ආයතන වේ. ලැබෙන ඉල්ලීම් අනුව, කෙෂේත්‍ර පරීක්ෂණ මඟින් තහවුරු කර ගැනීමෙන් පසු එම ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.ලක්ෂ දෙකක් දක්වා මූල්‍යාධාර ලබාදීමට මෙම වැඩසටහනින් කටයුතු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
ආයතන 03	1.00	0.6

ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම

මෙවර ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම් උළෙල "ප්‍රවේශ විය හැකි සාධාරණ ලෝකයක් පෝෂණය කිරීමේ දී නවෝත්පාදනයේ කාර්යභාරය ඇතුළත් සංවර්ධනය සඳහා පරිවර්තනීය විසඳුම්" යන්න තේමාව කර ගනිමින් අරලිය ගහ මන්දිරයේ දී ජාත්‍යන්තර ආබාධිත දින උත්සවය පවත්වනී ලදී. 2022 පැරා ඔලිම්පික් හා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවයේ දී විශේෂ දක්ෂතා දැක්වූ 10 දෙනෙකු සඳහා සිහිවටනත් විශ්ව විද්‍යාල ප්‍රවේශයලත් අඩු ආදායම්ලාභී ආබාධ සහිත දූ දැරියන් 10 දෙනෙකුට රු.75,000/- බැගින් මුදල් ත්‍යාග ලබා දීම සිදු කර ඇගයීමට ලක් කරන ලදී. මෙම වැඩසටහන සඳහා රු.මී 2.87 ක වියදමක් දරා ඇත.

නිවාස ආධාර ලබාදීම

කිසිම ආදායම් මාර්ගයක් නොමැති, ඉඩමක් සඳහා හිමිකම් ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනා දීමේ වැඩසටහන 2001 වසරේ සිට ක්‍රියාත්මක කරන අතර, ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා ලොතරැයිය මඟින් ලබන ආදායමින් 5%ක් වාර්ෂිකව මෙම අරමුදල සඳහා වෙන් කිරීමෙන් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලැබේ.

නව නිවසක් ඉදි කිරීම සඳහා රු.250,000/- ක මුදලක් ද අලුත්වැඩියා කර ගැනීමක් සඳහා 150,000/- ක මුදලක් වාරික වශයෙන් ලබා දේ.

ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත මෙම වැඩසටහන මන්දගාමී ස්වරූපයක් ගෙන ඇති අතර නිවාස සිහිනය ඇතිව පොරොත්තු ලේඛනවල රැඳී සිටින පිරිස 1650 අධිකය.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන ප්‍රමාණය(රු.මී)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
113	12.00	9.36

ඉදිරි ඉලක්ක

- 2023 දී ආබාධ සහිත තැනැත්තන් 50 ක් රැකියාගත කිරීම.
- සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම.

- දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම.

- 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධන අවසන් කිරීම.

- ආබාධ සහිත තැනැත්තන්ට රැකවරණය සපයන ආයතන 03ක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.

- සංඥා භාෂාව රාජ්‍ය නිලධාරීන් සඳහා අතිරේක විෂයක් ලෙස ස්ථාපිත කිරීම.

ජයමාලි සී වික්‍රමආරච්චි

අධ්‍යක්ෂ

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. ආයතනික තොරතුරු

පොදු

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය (NSPD) යනු 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ 1996 ඔක්තෝබර් 24 වැනි දින ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද ආයතනයකි. NSPD හි ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියරෙහි 1 වන මහලේ පිහිටා ඇත.

ජාතික ආබාධිත මහලේකම් කාර්යාලය, ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසික ජීවන වියදම් ආධාර, ස්වයං රැකියා ආධාර, අධ්‍යාපන ආධාර, වෛද්‍ය ආධාර වැනි ආධාර සැපයීමේ කාර්යයේ නියැලී සිටී.

මීට අමතරව, ජාතික ආබාධිත මහලේකම් කාර්යාලය විසින් CKDU (රෝග මූලය හදුනානොගත් වකුගඩු රෝග) රෝගීන් සඳහා මාසික ආධාර ප්‍රදානය කිරීම සහ තනි මාපිය පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ප්‍රදානය කිරීම NSPD සම්බන්ධීකරණය කරයි.

02. අනුකූලතා ප්‍රකාශය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇති අතර 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූල වේ.

03. ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

සාමාන්‍ය ප්‍රතිපත්ති

3.1.1 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ආසන්නතම රුපියලට වටයා ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරවල භාවිත කළ ඒවාට අනුරූපී වන සේ යොදාගෙන ඇත.

3.1.2 සංසන්දනාත්මක තොරතුරු

වර්ථමාන තත්ත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය විටෙක පෙර වසරේ සංඛ්‍යා දත්ත සහ පියවරයන් නැවත සකසා ඇත.

3.1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා සුදුසු අවස්ථාවලදී, මුල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහනෙහි හෙළිදරව් කිරීම් ගැලපීම් සිදු කර ඇත .

3.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිනුම් පදනම

3.2.1 තොගය

යල් පැන ගිය සහ මන්දගාමී අයිතම සඳහා තොගය මනිනු ලබන්නේ හිඟ දීමනා වලින් පසුව, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තකදී තොගය අලෙවි කළ හැකි මිලෙන් ඇස්තමේන්තුගත නිම කිරීමේ පිරිවැය සහ ඒහි ඇස්තමේන්තුගත විකිණුම් පිරිවැය අඩු කළ පසු අගයයි.

තොගය එහි වර්තමාන ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය සහ කොන්දේසි පහත පරිදි ගණන් ගනු ලැබේ- :

පරිභෝජන ද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය (FIFO) මත පදනම්ව සැබෑ පිරිවැය.

3.2.2 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන, මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දන්නා මුදල් ප්‍රමාණයන් සහ වටිනාකමේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවදානමකට යටත් වන දේ ලෙස අර්ථ දක්වා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් සහ මුදල් වලට සමාන දෑ අතැති මුදල් සහ බැංකු තැන්පතු ලෙස සලකණු ලැබේ.

3.2.3 දේපල, පිරියත සහ උපකරණ

a) පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ, පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් හානියක් පාඩුවක් හෝ ලාභයක් යටතේ වාර්තා කරනු ලැබේ.

b) ප්‍රතිස්ථාපන පිරිවැය

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දේපල, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම්, දැරූ විට වියදමක් ලෙස පිළිගැනේ.

c) ක්ෂයවීම්

ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ වසර ආරම්භයේ පොත්වල පවතින වත්කම්වල අඩුවන හෝ හීනවන අගයේ ස්ථාවර ප්‍රතිශතයක් ලෙස හීනවන ශේෂ ක්‍රමය භාවිතා කිරීමෙනි. අගය. SLPSAS 7 අනුව සෑම වසරකම ක්ෂයවීම් ප්‍රමාණය අඩු වේ.

ගෘහ භාණ්ඩ සහ උපාංග	15%
පරිගණක සහ IT උපකරණ	15%

3.3 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍රයේ වත්මන් වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ.

3.3.1 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස NSPD හට වර්තමාන වගකීමක් (නීතිමය හෝ නිර්මාණාත්මක) ඇති විට වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වන අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි අවස්ථාවකදී වෙන්කිරීම් පිළිගනු ලැබේ.

3.4 විස්තීරණ ආදායම ප්‍රකාශය

3.4.1 ආදායම් හඳුනාගැනීම

රාජ්‍ය ප්‍රදානයන්

ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානයන් වෙන වෙනම හඳුනාගෙන ඇත. ප්‍රාග්ධන ප්‍රදානය ප්‍රධාන ආදායම් ප්‍රභවය වන අතර එය ආදායම් ප්‍රකාශයට බැර වේ.

මීට අමතරව, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සුපිරිවාසනා සම්පත අලෙවි කිරීමෙන් ලබන ලාභයෙන් සියයට පහක (5%) ප්‍රතිශතයක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින්

ආබාධ සහිත පුද්ගලයන් වෙත නිවාස ආධාර ලබාදීම සඳහා ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලබා දේ.

3.4.2 වියදම් පිළඟැනීම

අ) ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගෙන ඇත්තේ දැරීමට සිදුවන පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ක්‍රියාත්මක වීම අතර සෘජු සම්බන්ධයක් මත ය; ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් වර්ෂයේ ආදායමෙන් අයකර තිබේ.

ආ) ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා, වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය NSPD හි කාර්යසාධන අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව ජාතික සභා සාමාජිකයින්ගේ එකගතාවය වන බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කෙරේ.

3.4.3 මුදල් ප්‍රවාහය

NSPD හි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) 02 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව "වක්‍ර ක්‍රමය" භාවිතා කර ඉදිරිපත් කර ඇත.

4.0 බැදීම් සහ අවිනිශ්චිතතාවයන්

අවිනිශ්චිතතාවයන් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැදීම් වන අතර ඒවා NSPD හි පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කරනු ලැබේ.

5.0 සභාවේ සාමාජිකයින්ගේ වගකීම් ප්‍රකාශ

මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී ඉදිරිපත් කිරීමේ වගකීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් භාර ගනී.

6.0 අවසාන ගිණුම සඳහා අනුමැතිය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් මෙම අවසන් ගිණුම 2023.02.16 දින පැවති ජාතික සභා රැස්වීමේදී අනුමත කර ඇත.

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

ශේෂ පිරික්සුම

2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

විස්තරය	ගලපන ලද ශේෂ පිරික්සුම	
	DR	**CR**
NSPD ජංගම ගිණුම - BOC 2938104	9,834,598	
නිවාස ජංගම ගිණුම - BOC 7040561	928,711	
පරිගණක හා පරිගණක උපකරණ -පිරිවැය	4,117,485	
කාර්යාලීය ගෘහ භාණ්ඩ - පිරිවැය	279,926	
නිවාස ආධාර	12,509,425	
ආධාරක උපකරණ	8,296,276	
ජාත්‍යන්තර ආබාධිත දිනය	2,898,465	
වෛද්‍ය ආධාර	11,338,291	
ස්වයං රැකියා	4,091,560	
අධ්‍යාපන ආධාර	4,344,169	
කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන්	300,000	
බ්‍රේල් පුහුණු වැඩසටහන	-	
ප්‍රකාශන මුද්‍රණය හා වෙනත් මාධ්‍ය කටයුතු	-	
ස්වයං-ආධාර ස්වේච්ඡා සංවිධාන	600,000	
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා	2,750,130	
විශේෂ පාසැල් සඳහා ආධාර	-	
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - 1000	759,325	
වෙනත් වියදම්	659,420	
කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්	20,457	
පරිගණක සහ පරිගණක උපාකරණ ක්ෂයවීම්	531,516	
විගණන ගාස්තු	78,000	
සුපිරි වාසනා ලොතරැයියෙන් ලැබිය යුතු මුදල	82,597,195	
රජයේ ආධාර ලැබීම්		31,880,000
සුපිරි වාසනා සම්පත ආධාර ලැබීම්		90,012,050
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා		2,575,000
වෙනත් ලැබීම්		6,247,152
විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්		156,000
පරිගණක සහ පරිගණක උපකරණ - සමුච්චිත ක්ෂයවීම්		1,105,564
කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම්		164,006
2021.12.31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය		14,795,178
	146,934,949	**146,934,949**

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)	**2022**	**2021**	
මෙහෙයුම් ක්‍රියකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
අතිරික්තය/(හිඟය)	81,537,169	444,758	* Restated
මුදල් නොවන අයිතම			
ක්ෂයවීම	551,972	598,114	
බොල් ණය සඳහා වෙන්කිරීම් වැඩිවීම	-	-	
ගෙවිය යුතු මුදල් වැඩිවීම	78,000	(417,579)	* Restated
ණයට ගැනීම් වැඩිවීම	-	-	
සේවක වියදම් සම්බන්ධ වෙන්කිරීම් වැඩිවීම	-	-	
දේපල,පිරියත හා උපකරණ විකිණීම මත (ලාභ) / පාඩු	-	-	
ආයෝජන විකිණීම මත (ලාභ) / පාඩු	-	-	
වෙනත් ජංගම වත්කම් වැඩිවීම්			
නැවත තක්සේරු කිරීම තුළ ආයෝජන වැඩිවීම	-	-	
ලැබියයුතු මුදල් වැඩිවීම	(76,612,050)	(2,395,300)	
මෙහෙයුම් ක්‍රියකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**5,555,091**	**(1,770,007)**	
ආයෝජන ක්‍රියකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පිරියත හා උපකරණ මිලටගැනීම	-	(1,560,348)	
පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ ආදායම	-	-	
ආයෝජන විකිණීමෙන් ලැබූ ආදායම	-	-	
විදේශ මුදල් සුරැකුම්පත් මිලටගැනීම	-	-	
ආයෝජන වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**	**(1,560,348)**	
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-	
ණය ගැනීම් වලින් ලැබෙන ආදායම	-	-	
ණය ආපසු ගෙවීම්	-	-	
බෙදාහැරීම් / රජයට ලාභාංශ ලැබීම්	-	-	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**	**-**	
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම	**5,555,091**	**(3,330,354)**	
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)	5,208,219	8,538,573	
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)	**10,763,310**	**5,208,219**	

සටහන අ
මුදල් හා මුදල් සමාන දෑ
නිතකර ශේෂයන්

NSPD ජංගම ගිණුම - BOC 2938104	9,834,598	5,170,082
නිවාස ජංගම ගිණුම - BOC 7040561	928,711	38,136
කේටි කාලීන ආයෝජන	-	-
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	**10,763,309**	**5,208,219**

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)	සටහන	2022	2021	
වත්කම්				
ජංගම වත්කම්				
ලැබිය යුතු මුදල් හා තැන්පතු	**01**	82,597,195	5,985,145	
මුදල් හා මුදල් සමාන දෑ	**02**	10,763,309	5,208,219	
		93,360,504	**11,193,364**	
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත හා උපකරණ	**03**	3,127,842	3,679,814	
		3,127,842	3,679,814	
මුළු වත්කම්		**96,488,346**	**14,873,178**	
නිමිකම් සහ වගකීම්				
ජංගම වගකීම්				* Restated (Note 12)
වෙන්කිරීම්	**04**	156,000	78,000	
උපචිත වියදම්				
		156,000	**78,000**	* Restated
ජංගම නොවන වගකීම්				
				*
මුළු වගකීම්		**156,000**	**78,000**	Restated
				*
ශුද්ධ වත්කම්		**96,332,346**	**14,795,178**	Restated
ස්කන්ධ				* Restated (Note 12)
සමුච්චිත අතිරික්තය/(හිඟය)		96,332,347	14,795,178	
සංචිත				
ශුද්ධ නිමිකම		**96,332,347**	**14,795,178**	* Restated

ඉහතින් දක්වා ඇති 2022 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය සහ ඒ සමග අමුණා ඇති අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කරන ලද බවට සහතික වන්නෙමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සියළු වගකීම් අප විසින් දරන්නෙමු

.....	.....
යමුනා පෙරේරා	ජයමාලි සී. වික්‍රමආරච්චි
ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය	අධ්‍යක්ෂ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
.....	.....
සභා සාමාජික	සභා සාමාජික

සහතික
කළේ,

අයි.එම්.අයි.සී.ඉලංකෝන්

ගණකාධිකාරි
ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)*	**සටහන**	**2022**	**2021**
ආදායම	**05**	130,714,202	64,187,366
වෙනත් ආදායම්		-	-
		130,714,202	**64,187,366**
අඩුකළා : වියදම්			
සෘජු ප්‍රාග්ධන වියදම්	**06**	48,547,061	63,328,073
පරිපාලන සහ ආයතනික වියදම්	**07**	629,972	676,114
මුළු වියදම		**49,177,033**	**64,004,187**
මෙහෙයුම් වියදම් වලට වඩා ලැබූ ආදායම		**81,537,169**	**183,179**
අඩුකළා : මූල්‍ය සහ වෙනත් වියදම්		-	-
ශුද්ධ අතිරික්තය / (හිඟය) වෙනත් විස්තීර්ණ ආදායමට ඉදිරියෙන්		**81,537,169**	**183,179**
වෙනත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		**81,537,169**	**183,179**

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා
(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සමුච්චිත අරමුදල	එකතුව	
	රු. ශත	රු. ශත	
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**14,533,599**	**14,533,599**	
ගොඩනැගිලි වටිනාකම නැවත තක්සේරුකිරීම			
ඉඩම වටිනාකම නැවත තක්සේරුකිරීම			
පෙර වසරේ ගැලපීම (* නැවත සතස් කල, සටහන 12)	261,579	261,579	(සටහන 12)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය (ගලපන ලද)	14,795,178	14,795,178	
වසර තුළ ගැලපුම්			
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)	81,537,169	81,537,169	
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**96,332,347**	**96,332,347**	

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)*	**2022**	**2021**
සටහන - 01 - ලැබිය යුතු මුදල් හා තැන්පතු		
සුපිරි වාසනා සම්පත ලොතරැයියෙන් ලැබිය යුතු මුදල	82,597,195	5,985,145
	82,597,195	**5,985,145**
සටහන - 02 -මුදල් හා මුදල් සමාන දෑ		
නිතකර ශේෂයන්		
NSPD ජංගම ගිණුම- BOC 2938104	9,834,598	5,170,082
නිවාස ජංගම ගිණුම - BOC 7040561	928,711	38,136
	10,763,309	**5,208,219**

සටහන - 03
දේපල, පිරියත හා උපකරණ

3.1 පිරිවැය	**01.01.2021** දිනට ශේෂය	**එකතුවීම්/** මාරුකිරීම්	**බැහැරකිරීම්/** මාරුකිරීම්	**31.12.2022** දිනට ශේෂය
කාර්යාලීය ගෘහ භාණ්ඩ	279,926	-	-	279,926
පර්ගණක සහ පරිගණක උපාංග	4,117,485	-	-	4,117,485
	4,397,411	**-**	**-**	**4,397,411**

3.2 ක්ෂයවීම්	**01.01.2021** දිනට ශේෂය	**වාර්ෂික ක්ෂය/** මාරුකිරීම්	**බැහැරකිරීම්/** මාරුකිරීම්	**31.12.2022** දිනට ශේෂය
කාර්යාලීය ගෘහ භාණ්ඩ	143,549	20,457	-	164,006
පර්ගණක සහ පරිගණක උපාංග	574,048	531,516	-	1,105,564
	717,597	**551,972**	**-**	**1,269,569**

3.3 ශුද්ධ පොත් අගය	**31.12.2022** දිනට පිරිවැය	**සමුච්චිත ක්ෂයවීම 31.12.2022**	**ශුද්ධ පොත් අගය 31.12.2022**
කාර්යාලීය ගෘහ භාණ්ඩ	279,926	164,006	115,920
පර්ගණක සහ පරිගණක උපාංග	4,117,485	1,105,564	3,011,922
	4,397,411	1,269,569	3,127,842

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

සටහන - 03

දේපල, පිරියත සහ උපකරණ

3.3 ශුද්ධ පොත් අගය	**2022**	**2021**	
පිරිවැයට			
කාර්යාලීය ගෘහ භාණ්ඩ	115,920	136,377	
පරිගණක සහ පරිගණක උපාංග	3,011,922	3,543,437	
	3,127,842	**3,679,814**	

සටහන - 04 - වෙන්කිරීම්

			* Restated
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	156,000	78,000	(Note 12)
	156,000	**78,000**	

සටහන -05 - ආදායම්

රාජ්‍ය ප්‍රදානයන්	31,880,000	40,250,000
සුපිරි වාසනා ප්‍රදානයන්	90,012,050	12,895,300
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා	2,575,000	9,974,950
වෙනත් ලැබීම්	6,247,152	1,067,116
	130,714,202	**64,187,366**

සටහන - 06 - සෘජු ප්‍රාග්ධන වියදම්

නිවාස ආධාර	12,509,425	10,718,200
ආධාරක උපකරණ	8,296,276	13,115,132
ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම	2,898,465	3,457,384
වෛද්‍ය ආධාර	11,338,291	13,594,354
ස්වයං රැකියා	4,091,560	4,987,218
අධ්‍යාපන ආධාර	4,344,169	5,475,681
කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන්	300,000	142,498
බ්‍රේල් පුහුණු වැඩසටහන	-	-
ප්‍රකාශන මුද්‍රණය හා වෙනත් මාධ්‍ය කටයුතු	-	898,708
ස්වයං-ආධාර ස්වේච්ඡා සංවිධාන	600,000	575,000
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා	2,750,130	9,701,134
විශේෂ පාසැල් සඳහා ආධාර	-	-
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - 1000	759,325	29,175
වෙනත් වියදම්	659,420	633,590
	48,547,061	**63,328,073**

සටහන - 07 - පරිපාලන හා ආයතනික වියදම්

කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්	20,457	24,066
පරිගණක සහ පරිගණක උපාංග ක්ෂයවීම්	531,516	574,048
විගණන ගාස්තු	78,000	78,000
	629,972	**676,114**

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා
(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

සටහන -08 - හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්

වාර්තා කරන දිනය වන විට කිසිදු බැඳීමක් නොතිබිණි

සටහන -09 -අවිනිශ්චිත බැදීම් සහ අවිනිශ්චිත වත්කම්

09.1 අවිනිශ්චිත වත්කම්

වාර්තා කරන දිනය වන විට කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිත වත්කමක් නොපැවතිණි

09.2 අවිනිශ්චිත බැදීම්

වාර්තා කරන දිනය වන විට දැක්වීමට කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිත බැදීමක් නොතිබුණි

සටහන - 10 වාර්තා කරන දිනට පසුව සිදු වන සිදුවීම්

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන දිනයේ සිට මූල්‍ය ප්‍රකාශන සමග ගැලපීම් සිදුකළ යුතු හෝ හෙළිදරව් කළයුතු තත්වයේ කිසිදු තත්වයක් පැන නැගී නොමැත.

සටහන - 11 - අදාල පාර්ශ්වයයන් සමග ගනුදෙනු

ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය එහි ජාතික සභාවේ සාමාජිකත්වය එහි ප්‍රධාන කළමණාකාරීත්වය ලෙස සලකනු ලබයි

2021 වසර තුළ ප්‍රධාන කළමණාකාරීත්වය සමග හෝ ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයින් සමග හෝ LKAS 24- අදාල පාර්ශ්වයයන් සමග ගනුදෙනු - යටතේ හෙළිදරවු කළ යුතු ආකාරයේ කිසිදු ගනුදෙනුවක් සිදු වී නොමැත

සටහන - 12 - පෙර වසර ගැලපීම්

විගණන ගාස්තු ගිණුම සඳහා වෙන්කිරීම් ශේෂය නිවැරදි කිරීම

ජාතික විගණන කාර්යාලයේ තහවුරු කිරීම්වලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට විගණන ගාස්තුව සඳහා වැඩියෙන් දරා ඇති ප්‍රතිපාදන පහත පරිදි වේ.

	රු. ශත
31/12/2021 දිනට විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	339,579
2020 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	(78,000)
විගණන ගාස්තු සඳහා වැඩියෙන් දරා ඇති ප්‍රමාණය	261,579

2021විගණන ගාස්තු ගිණුම සඳහා ප්‍රතිපාදන	රු. ශත
2021 මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	339,579
විගණන ගාස්තු සඳහා වැඩියෙන් දරා ඇති ප්‍රතිපාදන ගැලපීම්	(261,579)
2021 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කරන ලද ශේෂය	78,000

2021 සමුච්චිත අරමුදල් ගිණුම	රු. ශත
2021 මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	14,533,599
විගණන ගාස්තු සඳහා වැඩියෙන් දරා ඇති ප්‍රතිපාදන ගැලපීම්	261,579
2021 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කරන ලද ශේෂය	14,795,178

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

ජනල් සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

දිනය	විස්තරය	වවුචර් අංකය	හර	බැර
1/1/2022	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම් - හර		261,579	
	සමුච්චිත අරමුදල			261,579
	(විගණන ගාස්තු අධි වෙන්කිරීම් නිවැරදි කිරීම)			
1/1/2022	NSPD ජංගම ගිණුම - BOC 2938104 -හර		5,170,082	
	නිවාස ජංගම ගිණුම - BOC 7040561-හර		38,136	
	පරිගණක හා පරිගණක උපකරණ -පිරිවැය-හර		4,117,485	
	කාර්යාලීය ගෘහ භාණ්ඩ - පිරිවැය -හර		279,926	
	සුපිරි වාසනා ලොතරැයියෙන් ලැබිය යුතු මුදල -හර		5,985,145	
	පරිගණක සහ පරිගණක උපකරණ - සමුච්චිත ක්ෂයවීම්			574,048
	කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම්			143,549
	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්			78,000
	2021.12.31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය			14,795,178
	(පෙර වසරේ ශේෂයන් ඉදිරියට ගෙන ඒම)			
12/31/2022	කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්-හර		20,457	
	කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම්			20,457
	(කාර්යාල ගෘහ භාණ්ඩවල වාර්ෂික ක්ෂයවීම් වාර්තා වීම)			
12/31/2022	පරිගණක සහ පරිගණක උපකරණ ක්ෂයවීම්-හර		531,516	
	පරිගණක සහ පරිගණක උපකරණ - සමුච්චිත ක්ෂයවීම්			531,516
	(පරිගණක සහ තොරතුරු තාක්ෂණ උපකරණවල වාර්ෂික ක්ෂයවීම් වාර්තා කිරීම)			
12/31/2022	විගණන ගාස්තු		78,000	
	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්			78,000
	(2022 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන් කිරීම)			

ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

ජනල් සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

දිනය	විස්තරය	වවුචර් අංකය	හර	බැර
12/31/2022	රජයේ ආධාර ලැබීම්-හර		31,880,000	
	සුපිරි වාසනා සම්පත ආධාර ලැබීම්-හර		90,012,050	
	ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා-හර		2,575,000	
	වෙනත් ලැබීම්-හර		6,247,152	
	නිවාස ආධාර			12,509,425
	ආධාරක උපකරණ			8,296,276
	ජාත්‍යන්තර ආබාධිත දිනය			2,898,465
	වෛද්‍ය ආධාර			11,338,291
	ස්වයං රැකියා			4,091,560
	අධ්‍යාපන ආධාර			4,344,169
	කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන්			300,000
	ස්වයං-ආධාර ස්වේච්ඡා සංවිධාන			600,000
	ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා			2,750,130
	ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - 1000			759,325
	වෙනත් වියදම්			659,420
	කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්			20,457
	පරිගණක සහ පරිගණක උපාකරණ ක්ෂයවීම්			531,516
	විගණන ගාස්තු			78,000
	සමුච්චිත අරමුදල			81,537,169
	(ආදායම් සහ වියදම් සමුච්චිත අරමුදලට මාරු කිරීම වාර්තා කිරීම)			

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව හා ඒ සම්බන්ධ පිළිතුරු

1.5 (අ) **පාලක සභාව විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් රැස්විය යුතු වුවත්, 2022 වර්ෂය සඳහා රැස්වීම් වාර 03ක් පමණක් පවත්වා තිබුණි.**

රටේ පැවති දේශපාලන හා ඉන්ධන වැනි අර්බුදකාරී හේතූන් මත ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභා රැස්වීම් 03 කට සීමා විය විස්තරාත්මකව සාකච්ඡාකල යුතු කරුණු සඳහා සාමාජිකයින් ඇතුළත් කර පත් කරන ලද අනුකමිටු රැස්වීම් වාර 12ක් පවත්වා ඇති හෙයින් ජාතික සභා රැස්වීම් වාර සංඛ්‍යාව අඩුවුවද ගැටළුවක් වී නොමැත.

2023 වර්ෂය සඳහා අගෝස්තු මාසය වන විට පාලක සභා රැස්වීම් 05 ක් හා අනු කමිටු 10 ක් පවත්වා ඇත.

(ආ) සමාලෝචිත වර්ෂයේ මහ ලේකම් කාර්යාලයේ කාර්යය සාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.

2022 වාර්ෂික වාර්තාව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත ඉදිරිපත් කර 2023.07.10 දින සභාවෙන් අනුමැතිය ලබා ගත් අතර එය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. කැබිනට් අනුමැතිය ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තු ගත කිරීමට නියමිතය.

සභාවේ සාමාජිකයන් රැස්වී සාකච්ඡා කර තීන්දු තීරණවලට එළඹීමට අවකාශය සලසා ගැනීම යහපත් තත්ත්වයක නොපැවතීම හේතුවෙන් සභාවේ කාර්යයන් ප්‍රමාණාත්මක ලෙස ඉටුකිරීමේ ඉඩකඩ සලසාගෙන නොතිබුණි. ඒ තුලින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ලා අහිතකර ලෙස බලපා තිබුණි.

2022 වර්ෂයේ දී රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් සභාවාර කිහිපයකට සීමා වුවත් ජාතික සභා රැස්වීම්වලට අමතරව අනු කමිටු සභාවාර 12ක් පවත්වා එම කමිටුවල නිර්දේශ පාලක සභා රැස්වීම් වෙත යොමු කර අවශ්‍ය තීරණ ගෙන ඇත. නමුත් 2023 වර්ෂය අගෝස්තු මාසය වන විට පාලක සභා රැස්වීම් 05 ක් හා අනු කමිටු 10 ක් පවත්වා ජාතික සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කර ඇත.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ඉකුත් වී ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.133,492 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

බැංකු ජංගම ගිණුමේ මාස 06 කට වැඩි කාලයක් කල් ඉකුත් වූ චෙක්පත් 14 ක් සම්බන්ධව කටයුතු අවසන් කර ඇත.

මුදල් රෙගුලාසි අනුව කටයුතු කර ඇත.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) **ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධන ප්‍රවර්ධනය කිරීම සහ ඔවුනගේ අයිතිවාසික්ම ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම.**

සංඥා භාෂා පනත් කෙටුම්පත

2023.07.13 දින සංඥා භාෂා පනතෙහි අමාත්‍යාංශ නිරීක්ෂණ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ මූලික කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා අධිකරණ අමාත්‍යාංශය හරහා අවසන් නිරීක්ෂන කටයුතු සඳහා නැවත අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී. අයිතිවාසිකම් පනතෙහි සකස් කරන ලද නිරීක්ෂන 2023.08.22 දින අධිකරණ අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

ප්‍රවේශ පහසුකම් ගැසට් පත්‍රය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ගැසට් කමිටුව හා ප්‍රවාහන අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා වට කිහිපයක්ම පවත්වන ලදී. වර්තමාන තත්ත්වය වනුයේ ප්‍රවේශ පහසුකම් ගැසට් පත්‍රය සම්බන්ධ අදාළ අමාත්‍යාංශ හා අධිකාරී වෙත ඒ ඒ ආයතනයන් සම්බන්ධ ඇතුළත් කර ඇති කාරණා පිළිබඳ ආයතන මට්ටමින් සාකච්ඡා පවත්වා එම කරුණුවල නිරීක්ෂන හා යෝජනා ඇත්නම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත.

(ආ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයේ වූ අදාල ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලා ගැනීම.

- ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුකූලව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත කෙටුම්පත් කර ඇත.
- ශ්‍රී ලංකාව 2016 වර්ෂයේ දී අපරානුමතකොට ඇති එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සම්මුතියට අනුව පළමු මූලික වාර්තාව 2018 වර්ෂයේ දී එක්සත් ජාතීන් වෙත යොමුකොට ඇත.

(ඇ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවැද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ වෙබ් පිටුවේ, මුහුණු පොත හා WhatsApp ගිණුම මඟින් සියලු සේවාවන් පිළිබඳ විස්තර ඇතුළත් කොට ඇත.

ස්වර්ණවාහිනී නාලිකාවේ මෙහෙවර රූපවාහිනී වැඩසටහන මඟින් ද මහජනතාව දැනුවත් කරන ලදී.

රාජ්‍ය ආයතන මඟින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශනවලදී ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙන් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම, අත්පත්‍රිකා බෙදා දීම මඟින් ද මහජනතාව දැනුවත් කරන ලදී,

ජංගම සායනවලදී, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සමාජ සේවා නිලධාරීන් මඟින් සේවය අවශ්‍ය තැනැත්තන් සඳහා තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත.

(ඈ) ආබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ එලදායී පියවර ප්‍රවර්ධනය කිරීම.

ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් තවදුරටත් ආබාධ සහිත තත්ත්වයට පත්වීම වැළැක්වීම අරමුණු කර ගනිමින් වෛද්‍ය ආධාර වැඩසටහන ක්‍රියාත්මක වේ.

- වෛද්‍යාධාර වැඩසටහන් මඟින් 2022 වර්ෂයේ ප්‍රතිලාභීන් 683 දෙනෙකුට රු.මි. 10.44 ක ආධාර මුදල් ලබා දී ඇත. 2023 ජූලි 31 දින වන විට 369 දෙනෙකුට රු.මි. 6.28 ක ආධාර මුදල් ලබා දී ඇත.

- 2022 වර්ෂයේ ප්‍රතිලාභීන් 13,956 දෙනෙකුට ආධාරක උපකරණ ලබා දී ඇත. (ඇස් කණ්නාඩි, අත්වාරු, කිහිලිකරු, රෝද පුටු ආදී උපකරණ) 2023 වර්ෂයේ ජූලි 31 දින වන විට ප්‍රතිලාභීන් 5807 දෙනෙකුට ආධාරක උපකරණ ලබා දී ඇත. (ඇස් කණ්නාඩි, අත්වාරු, කිහිලිකරු, රෝද පුටු ආදී උපකරණ)

(ඉ) ආබාධ සහිත තැනැත්තන් පුනරුත්තාපනය කිරීම සඳහා ගතයුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරීම.

රැකවරණ මධ්‍යස්ථාන 06ක් සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. ලෝක බැංකු ආධාර යටතේ පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ඉදි කිරීමේ කටයුතු අවසන් කර ඇත. ඊට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින අතර අවශ්‍ය භාණ්ඩ ආසියානු සංවර්ධන බැංකු (ADB) ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේ මිලදී ගැනීමට කටයුතු සූදානම් කර ඇත. කාර්යමණ්ඩලය බඳවා ගැනීමට බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. ඒ අනුව අකුරැස්ස මධ්‍යස්ථානයේ කාර්යයන් හැකි ඉක්මනින් ආරම්භ කිරීමට නියමිතය. පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන ආබාධ සහිත තැනැත්තන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන ලියාපදිංචි කර අවශ්‍ය නියාමන කටයුතු ද සිදු කරනු ලැබේ.

(ඊ) ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි දෙවන අදියර ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම් සකස් කර ඇත. පවත්නා ආර්ථික අර්බුදය හමුවේ ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසුතාවයක් පවතී.

(උ) ආබාධ සහිත තැනැත්තන්ට නැවතිම් පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දීම.

රැකවරණ මධ්‍යස්ථාන 06 ඉදිකළ පසු ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සැලසීමද රැකබලා ගැනීම හා අවශ්‍ය පුහුණු ලබා දීම ද සිදු කළ හැකි වනු ඇත. අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් අවසන් කර ඇත. දෙවන අදියර ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

වර්තමානයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන 11 ක් මඟින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දෙනු ලබයි.

සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් කාන්තාවන් සඳහා බටුගම්මන රැකවරණ මධ්‍යස්ථානයක් ද පිරිමින් සඳහා පුවක්පිටිය රැකවරණ මධ්‍යස්ථානයක් ද පවත්වාගෙන යනු ලබයි.

(ඌ) ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙල හඳුන්වාදීම සහ තොරතුරු ලබා ගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබා ගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

විශේෂ ගැසට් නිවේදනය මඟින් 2006 අංක 01 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ප්‍රවේශ නියෝගය ප්‍රකාශයට පත් කර ඇති අතර ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුව ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය සංශෝධන සිදු කර සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මේ පිළිබඳව ප්‍රවාහන අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය ආදී ආයතන සමඟ සම්බන්ධ වී සාකච්ඡා පවත්වා ඇති බව කාරුණිකව දන්වමි.

(එ) ප්‍රකාශන පල කිරීමෙන් සහ වෙනත් වැඩපිලිවෙලවල් මඟින් ආබාධ සහිත තැනැත්තනගේ තත්ත්වය සහ අවශ්‍යතා පිළිබඳව මහජනයා දැනුවත් කිරීම.

2022 වර්ෂයේ පවත්වන ලද ජංගම සේවා 19 හි දී හා දහසක් සවිබලගැන්වීමේ වැඩසටහන් 02හි දි මහජනතාව දැනුවත් කරන ලදී. කාර්යාලීය වෙබ් පිටුව හරහා සහ මුහුණු පොතෙහි ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ ගිණුම මඟින් ද මහජනතාව දැනුවත් කරනු ලැබේ. දෙසැම්බර් 03 දිනට යෙදෙන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන් තුලින් මහජනතාව දැනුවත් කරන ලදී .

2023 වර්ෂයේ පවත්වන ලද ජංගම සේවා 09 හි දී හා කාර්යාලීය වෙබ් පිටුව හරහා සහ මුහුණු පොතෙහි ආබාධ සහිත තැනැත්තන්ගේ ගිණුම මඟින් ද මහජනතාව දැනුවත් කරනු ලැබේ. තව ද 2023 වර්ෂයේ ජනවාරි මාසයේ දී ස්වර්ණවාහිනී නාලිකාවේ මෙහෙවර වැඩ සටහන මඟින් මහජනතාව දැනුවත් කරන ලදී.

(ඒ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබාගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම.

ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සිදු කරනු ලබන විවිධ මහජන වැඩසටහන් වෙබ් පිටුව, මුහුණු පොත සහ රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන්වලදී සුදුසු දැනුවත් කිරීම් හා ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. ඊට අමතරව ස්වයං රැකියා ආධාර , අධ්‍යාපන ආධාර , වෛද්‍යාධාර, නිවාස ආධාර සහ මාසික ජීවනාධාර ලබා දී ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලදී.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) **(i) සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ නිවාස ආධාර වැඩසටහනට 2021 දෙසැම්බර් 31 වන විට රු.5,985,145 ක මුදලක් හා 2022 දෙසැම්බර් 31 වන විට රු.90,012,050 ක මුදලක් හා 2022 දෙසැම්බර් 31 වන විට රු.90,012,050 ක මුදලක් නිවාස ආධාර වශයෙන් ලැබිය යුතු වුවත් රු.13,400,000 ක මුදල් ප්‍රමාණය පමණක් ලබාගෙන ඇති අතර ඉතිරිය රු.82,597,195 ක් හිඟ ආදායම් වේ. මේ හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණු නිසියාකාරව සාක්ෂාත් කර ගෙන නොතිබුණි.**

විගණනයෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය වෙතින් ලැබිය යුතු ආදායම පිළිබඳව ලිඛිතව තොරතුරු ලබා ගන්නා ලදී. ජාතික ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිගේ අංක NLB/FIN/OF/03/02/ii දරණ 2023 මාර්තු 28 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති තොරතුරු අනුව මහා භාණ්ඩාගාරය විසින් ලබාදීමට එකඟ වූ හා ලබාදී තිබුණු මුදල නිවැරදි බව තහවුරු විය.

(ii) එමෙන්ම 2006 සිට සමාලෝචිත වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 19 ක ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ නිවාස ආධාර වැඩසටහනේ ඉදිකිරීම් අවසන් වීමට පෙර නතර වූ නිවාස 111 ක් සඳහා රු.9,632,261 ක් වියදම් දරා තිබුණි. මේ හේතුවෙන් නිවාස ආධාර වැඩ සටහනේ අරමුණු නිසියාකාරව ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

නිවාස ආධාර ලබාදීමේ වැඩසටහනේ දී 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ආධාර ලබා දෙමින් සිටින අතරතුරදී ආධාර ලබාදීමට නුසුදුස්සෙකු වීම

හේතුවෙන් ආධාර ලබාදීම අතරමැදදී අත්හිටුවීමට සිදුවිය. එම ගෙවීම් අතරමැද අත්හිටුවන ලද ආධාරලාභීන් සංඛ්‍යාව (111) මුළු ආධාරලාභීන්ගෙන් (3891) 2.8% කි.

කාරණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ප්‍රතිලාභියා මිය යාම	39
ප්‍රතිලාභියා පදිංචිය හැර යාම	17
ඉඩම් ආරවුල්	04
දෙමව්පියන්/රැකවරන අභිමිවීම	04
ඉදිකිරීම් ප්‍රතික්ෂේප කිරීම	17
වෙනත් උපකාර ලැබීම	13
නිවාස විකිණීම	03
ආපදාවන්ට ලක්වීම	02
රෝගී තත්වයන් උත්සන්වීම නිසා ඉදිකිරීම් නවතා දැමීම	01
ආදායම ඉහල යාම	09
ආබාධිත බව සුව වීම	01
නාය යාම්	01

කෙසේ වෙතත් මෙම වැඩසටහන ඉතා සාර්ථක වැඩසටහනක් බවත් මේ වන විට නිවාස 3891 ක් සඳහා ආධාර ලබාදී වැඩසටහනේ අරමුණු නිසියාකාරව ඉටුකර ගෙන ඇති බව කාරුණිකව දන්වමි. යම් අවස්ථාවලදී ආධාර මුදල් කොටසක් ලබාගත් පසු වෙනත් අයගෙන් උපකාර ලැබීම නිසා සමහර ආබාධිත තැනැත්තන්ගේ නිවාස සාර්ථකව ඉදිකර ඇත. එවිට නිවාස ආධාර ඉතිරි කොටස ලබාදීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුණ බැවින් ආධාර මුදල් ඉතිරි කොටස ගෙවීම අත්හිටුවන ලදී. එහෙත් වෙනත් ආධාර ලැබීම මගින් නිවාස වැඩසටහනේ අරමුණ නිසියාකාරව ඉටු වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. ලබාදෙනු ලබන ආධාර මුදල නිවසක් සම්පූර්ණයෙන්ම ඉදිකර ගැනීමට ප්‍රමාණවත් නොවන බැවින් වෙනත් ආධාර ද ලබාගත යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි. ඉතිරි මුදල්

ලබා ගැනීම සඳහා 2023.04.30 දින හා 2023.08.31 යන දිනයන්හි ලිපි මඟින් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.

(ආ) ආබාධ සහිත තැනැත්තන්ට සමාන අවස්ථා ලබාදීම, සවිබල ගැන්වීම, සුභසාධනය හා සුභසිද්ධිය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය, අබාධිත තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා ආබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් ද පෙන්වා දුන් නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා කාර්යක්ෂම ලෙස පියවර ගෙන නොතිබුණි.

සමාජ ප්‍රතිලාභ මණ්ඩලය මඟින් එක්රැස් කරන දත්ත ලබා ගැනීමටත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන දත්ත පද්ධතිය මඟින් මෙම දත්ත එකතු කර ගැනීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇත. සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය දත්ත රැස්කර ගැනීමට සාකච්ඡා පවත්වා ඇති අතර 2023 වර්ෂයේ දී සංගණනයක් කිරීමට නියමිත බවත් ඒ හරහා ප්‍රමාණවත් දත්ත ලබා දිය හැකි බවත් සාකච්ඡාවේදී සඳහන් කර ඇත.

(ඇ) වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, අභිසංවර්ධනය, ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේ ද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට අදාළ පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුනි.

සියලුම අධාර වැඩසටහන් පිළිබඳව පසුවිපරම් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සමාජ සේවා නිලධාරී/සංවර්ධන නිලධාරී (සමාජ සේවා) විසින් සිදුකරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීන් විසින් එම කටයුතු අධීක්ෂණය කරනු ලැබේ. පසුවිපරම් වාර්තා සමාජ සේවා නිලධාරීන් මඟින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත ගෙන්වා ගනු ලබන අතර ඒවා ඇගයීම් කරනු ලැබේ.

3.3 අරමුදල් ඌන උපයෝජනය

අරමුදල සඳහා ලැබෙන රජයේ ප්‍රධාන උපයෝජනය කර ඉතිරිවන අතිරික්ත මුදල් ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 9,834,598 ක් වූ අතර ඉකුත් වර්ෂ 04 ක

කාලය තුළ එය රු. 5,170,082 සිට රු.12,062,703 දක්වා පරාසයක වූ මුදල් ශේෂ බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 19 වෙන වගන්තිය ප්‍රකාරව සභාවට අයත් යම් මුදලක් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ආයෝජනය කළ හැකි වුවත් ඉකුත් වර්ෂ 05 ක කාලය තුල එසේ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අරමුදලට අහිමි වී තිබුණු පොළී ආදායම දළ වශයෙන් රු.4,300,000 ක් බව නිරීක්ෂණය විය.

2023 දෙසැම්බර් 23 දින පැවති විගණන හා කළමනාකරණ රැස්වීමේ දී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සුදුසු බව නිර්දේශ කරන ලදී. එම නිර්දේශය 2023 පෙබරවාරි 16 වන දින පැවති ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවට යොමු කරන ලදී. එහිදී තීරණය කරන ලද පරිදි බත්තරමුල්ල, ලංකා බැංකු ශාඛාවේ (අධි ශ්‍රේණි) මිලියන 05 ක් දින 400 ක් සඳහා 25% ක වාර්ෂික පොළී අනුපාතයකට සහ මිලියන 02 ක් මාස 03 ක් සඳහා 24% ක වාර්ෂික පොළී අනුපාතයකට ස්ථාවර තැන්පතු ආරම්භ කරන ලදී.

3.4 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව සංස්ථාපිත ආයතනයක් ලෙස මහලේකම් කාර්යාලය පිහිටුවා තිබියදී රේඛීය රාජ්‍ය ආමාත්‍යාංශයේ හා වෙනත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් හා සේවයකයින් අභ්‍යන්තර අනුයුක්ත කිරීම් කරවාගෙන තිබුණි. එසේ ජාතික මහ ලේකම්කාර්යාලයේ සේවයේ නියුක්තව රාජකාරී කළ නිලධාරීන් 24 දෙනෙකු සඳහා රු.15,237,256 ක් පමණ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් ද නිලධාරීන් තිදෙනෙක් සඳහා රු.2,390,237 ක් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ද 2022 වර්ෂය තුලදී වැටුප් ගෙවා තිබුණි.

කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/B1/41/03 දරණ 2022 අගෝස්තු 08 දිනැති ලිපියෙන් සමාජ සේවා නිලධාරීන් 03 ක් අනුයුක්ත කර ගැනීමට අනුමැතිය ලබා දී ඇති අතර ඔවුන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. (සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සමාජ සේවා නිලධාරීන්ගේ සම්බන්ධීකරණ කටයුතු, ජීවනාධාර දීමනා ඇතුළු සියලුම දීමනා ලබා දීමේ දී පරීක්ෂා කර නිර්දේශ ලබා දීම ආදී කටයුතු සිදු කරනු ලැබේ.)

රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීම - 2020 යටතේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයට උපාධිධාරී අභ්‍යාසලාභීන් 28 දෙනෙකු යොමු කරන ලදී. උපාධිධාරී අභ්‍යාසලාභීන් 04 දෙනෙකු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කළ අතර ඉතිරි 24 දෙනා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලදී.

3.5 මානව සම්පත් කළමනාකරණය

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 මාර්තු 19 දින කාර්යය මණ්ඩලයේ තනතුරු අනුමත කර තිබුණ ද, බඳවාගැනීමේ පටිපාටිය පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

තාක්ෂණික නිලධාරී තනතුරු හා සංඥා භාෂා පරිවර්තක නිලධාරී තනතුර සඳහා සකස් කරනු ලැබූ බඳවා ගැනීම් පටිපාටි සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සංශෝධනයන්ට යටත්ව අනුමත කර ඇත. බඳවා ගැනීමේ පටිපාටි අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට සකස් කර ඇත.

(ආ) අනුමත කාර්යය මණ්ඩලයෙන් බැහැර සංවර්ධන නිලධාරී තනතුරු සඳහා බඳවාගෙන 27 දෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත සංවර්ධන නිලධාරීන් බඳවාගැනීම් සිදු කලේ නම් අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණත් එසේ කර නොතිබුණි.

අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය සඳහා අනුමැතිය ලබා ගැනීමට සැකසූ ලිපියක් 2023.05.09 දින පාලන අංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව පාලන අංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

ජයමාලි සී වික්‍රමආරච්චි

අධ්‍යක්ෂ


ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ඔබේ අංකය
எனது இல.
My No. එල්එස්ඩබ්ලිව්/ඩී/එන්එස්පීඩී/එෆ්එස්/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 23 දින



සභාපති,
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත ; 1. ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය
2. ලේකම් - මූදල්,ප්‍රාථමික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොළොන්නරුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொலன்னாவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.

එල්එස්ඩබ්/ඩී/එන්එස්පීඩී/එෆ්එස්/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

23 MAY 2023

දිනය
திகதி
Date

2023 මැයි 19 දින

සභාපති

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මහලේකම් කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මහලේකම් කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මහලේකම් කාර්යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මහලේකම් කාර්යාලය

ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගත්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා සාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව දැකුළක් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මහලේකම් කාර්යාලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මහලේකම් කාර්යාලය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.396 (ඇ)	2022 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ඉකුත් වී ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.133,492 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පනතේ 7(3) වගන්තිය	(i) පාලක සභාව විසින් යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් රැස්විය යුතු වුවත්, 2022 වර්ෂය සඳහා රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි. (ii) සභාවේ සාමාජිකයන් රැස්වී සාකච්ඡා කර තීන්දු තීරණ වලට එළඹීමට අවකාශය සලසා ගැනීම යහපත් තත්ත්වයක නොපැවතීම හේතුවෙන් සභාවේ කාර්යයන් ප්‍රමාණාත්මක ලෙස ඉටුකිරීමේ ඉඩකඩ සලසාගෙන නොතිබුණි. ඒ තුලින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ලා අහිතකර ලෙස බලපා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මහලේකම් කාර්යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනයට , අභිසංවර්ධනයට හා සංරක්ෂණ කිරීමට වගබලා ගැනීම වෙනුවෙන් වූ පහත දැක්වෙන කාර්යයන් ඉටුකිරීමට ජාතික සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(අ) ආබාධ සහිත තැනැත්තන්ගේ ශ්‍රමසාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අභිසංවර්ධනය කිරීම සම්බන්ධයෙන් රාණ්ඩුවට උපදෙස් දීම.

(ආ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාල ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති රාණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වග බලා ගැනීම.

(ඇ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබාගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම.

(ඈ) අබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම.

(ඉ) ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා ගතයුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

(උ) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීම.

(ඌ) ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩපිළිවෙල හඳුන්වාදීම සහ කොරතුරු ලබාගැනීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබාගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(එ) ප්‍රකාශන ඵල කිරීමෙන් සහ වෙනත් වැඩපිළිවෙලවල් මගින් ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය සහ අවශ්‍යතා පිළිබඳව මහජනයා දැනුවත් කිරීම.

(ඒ) ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රම පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ සඳහා ධෛර්ය දීම හා සියලු ක්‍රියාකාරකම් විෂයෙහි ලා ඔවුන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අරමුදල සඳහා ලැබෙන ඊජයේ ප්‍රධාන උපයෝජනය කර ඉතිරිවන අතිරික්ත මුදල් ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.9,834,598 ක් වූ අතර ඉකුත් වර්ෂ 04 ක කාලය තුල එය රු.5,170,082 සිට රු.12,062,703 දක්වා පරාසයක වූ මුදල් ශේෂ බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 19 වෙනි වගන්තිය ප්‍රකාරව සභාවට අයත් යම් මුදලක් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ආයෝජනය කළ හැකි වුවත් ඉකුත් වර්ෂ 05 ක කාලය තුල එසේ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අරමුදලට අහිමි වී තිබුණු පොළී ආදායම දල වශයෙන් රු.4,300,000 ක් බව නිරීක්ෂණය විය.

(ආ) ආබාධ සහිත තැනැත්තන්ට සමාන අවස්ථා ලබාදීම , සවිබල ගැන්වීම, සුභසාධනය හා සුභසිද්ධිය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය , වයස් ව්‍යුහය, අබාධිත තත්ත්වය , ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා අබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්ද පෙන්වා දුන් නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා කාර්යක්ෂම ලෙස පියවර ගෙන නොතිබුණි.

(ඇ) වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, අභිසංවර්ධනය , ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට අදාල පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අංක 16/1743/711/030 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ආබාධ සහිත තැනැත්තන්ගේ නිවාස ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහනට අරමුදල් සම්පාදනය වෙනුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පවත්වනු ලබන " සුපිරි වාසනා සම්පත " ලොතරැයි ත්‍යාදායමෙන් සියයට 5ක මුදලක් අයකරගත යුතුව තිබුණි. එකී ආදායම් නිවැරදි ලෙස ඇස්තමේන්තු කිරීම් හා ගණනය කිරීම් සිදුකර කථ්‍ය ආදායම , අයකර ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කරනු වෙනුවට මහාභාණ්ඩාගාරයෙන් ලබාදීමට එකඟ වූ හා ලබාදී තිබුණු මුදල පදනම් කරගෙන වර්ෂයේ ආදායම හා ලැබිය යුතු හිඟ ආදායම ගිණුම්ගත කර තිබුණි.

(i) සුසිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ නිවාස ආධාර වැඩසටහනට 2021 දෙසැම්බර් 31 වන විට රු.5,985,145 ක මුදලක් හා 2022 දෙසැම්බර් 31 වන විට රු.90,012,050 ක මුදලක් නිවාස ආධාර වශයෙන් ලැබිය යුතු වුවත් රු.13,400,000 ක මුදල් ප්‍රමාණය පමණක් ලබාගෙන ඇති අතර ඉතිරිය රු.82,597,195 ක් නිහ ආදායම් වේ. මේ හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණු නිසියාකාරව සාක්ෂාත් කර ගෙන නොතිබුණි.

(ii) 2006 සිට සමාලෝචිත වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 19 ක ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ නිවාස ආධාර වැඩසටහනේ ඉදිකිරීම් අවසන් වීමට පෙර නතර වූ නිවාස 111 ක් සඳහා රු.9,632,261 ක් වියදම් දරා තිබුණි.මේ හේතුවෙන් නිවාස ආධාර වැඩසටහනේ අරමුණ නිසියාකාරව ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු/ අතිරික්තතා සංඛ්‍යාව
ජේෂ්ඨ	6	5	1
තෘතීයික	3	3	-
ද්විතීයික	25	42	(17)
ප්‍රාථමික	6	2	4
එකතුව	40	52	

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 මාර්තු 19 දින කාර්යය මණ්ඩලයේ තනතුරු අනුමත කර තිබුණද, බඳවාගැනීමේ පටිපාටිය පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) අනුමත කාර්යය මණ්ඩලයෙන් බැහැර සංවර්ධන නිලධාරී තනතුරු සඳහා බඳවාගෙන 27 දෙනෙකුගේ අතිරික්තයක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත සංවර්ධන නිලධාරීන් බඳවාගැනීම් සිදු කලේ නම් අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළයුතුව තිබුණත් එසේ කර නොතිබුණි.

(iii) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව සංස්ථාපිත ආයතනයක් ලෙස මහලේකම් කාර්යාලය පිහිටුවා තිබියදී රේඛීය රාජ්‍ය අමාත්‍යාංශයේ හා වෙනත් දෙපාර්තමේන්තු වල නිලධාරීන් හා සේවකයින් අභ්‍යන්තර අනුයුක්ත කිරීම් කරවාගෙන තිබුණි. එසේ ජාතික මහලේකම් කාර්යාලයේ සේවයේ නියුක්තව රාජකාරී කළ නිලධාරීන් 24 දෙනෙකු සඳහා රු.15,237,256 ක් පමණ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් ද නිලධාරීන් තිදෙනෙක් සඳහා රු. 2,390,237 ක් සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් ද 2022 වර්ෂය තුලදී වැටුප් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති